# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය



**7 ශ්‍රේණිය**

**1 වන ඒකකය - මධ්‍ය සැකසුම් ඒකකය**

**සැකසුම - H.P.S. ශිරෝමි මෙය, මිනු/කලවාන සේනානායක ක.වි.**

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. සත්‍ය ද අසත්‍ය ද යන්න තෝරන්න.
මධ්‍ය සැකසුම් ඒකකය යනු, ලබා දෙන උපදෙස් අනුව ක්‍රියාත්මක වෙමින් දත්ත සැකසීම සිදු කරන අංකිත පරිපථයකි.
    i. සත්‍යයි.
    ii. අසත්‍යයි.

02. වරහන තුළ ඇති වචන අතරින් හිස්තැනට ගැලපෙන වචනය තෝරා ලියන්න.
(1940-1956 , මතක රෙජිස්තර , රික්තක නළ)
................................ යනු මධ්‍ය සැකසුම් ඒකකය භාවිත කරමින් සිටින දත්ත සහ උපදෙස් තාවකාලිකව රඳවා තබා ගන්නා ස්ථානයයි. පළමු පරම්පරාව කාල පරාසය ....................................... ලෙස දක්වා ඇති අතර එහිදී ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය ලෙස .............................. යොදා ගන්නා ලදී.

03. මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් 03 තෝරන්න.
    i. ගණිතමය හා තාර්කික ඒකකය
    ii. පාලන ඒකකය
    iii. පද්ධති ඒකකය
    iv. මතක රෙජිස්තරය

04. මධ්‍ය සැකසුම් ඒකකය පිහිටා ඇත්තේ පද්ධති ඒකකයේ කුමන කොටස තුළද?
    i. පාලන ඒකකය
    ii. මව් පුවරුව
    iii. සසම්භාවී ප්‍රවේශ මතකය
    iv. අභ්‍යන්තර දෘඪ තැටිය

05. වරහන තුළ ඇති වචන අතරින් හිස්තැනට ගැලපෙන වචනය තෝරා ලියන්න.
(ගණිතමය කාර්ය / තාර්කික කාර්ය)
ගණිතමය හා තාර්කික ඒකකයේ කාර්ය ........................... සහ ....................... ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි.

06. වරහන තුළ ඇති වචන අතරින් හිස්තැනට ගැලපෙන වචනය තෝරන්න. (රික්තක නළ / මයික්‍රො තත්පර / 1956- 1963 / 1940-1956 / මිලි තත්පර / ට්‍රාන්සිස්ටර්)

**පළමු වන පරම්පරාව**

භාවිතා කරන ලද ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය -..................................................
කාල පරාසය -..................................................
ක්‍රියාත්මක වේගය මනින ඒකකය -..................................................

**දෙවන පරම්පරාව**

භාවිතා කරන ලද ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය -..................................................
කාල පරාසය -..................................................
ක්‍රියාත්මක වේගය මනින ඒකකය -..................................................

07. හිස්තැනට ගැලපෙන පිළිතුර තෝරා ලියන්න.
(අනුකලිත පරිපථ / 1971-මේ දක්වා / පිකෝ තත්පර / නැනෝ තත්පර / 1964-1971 / ක්ෂුද්‍ර පරිපථ)

**තුන්වන පරම්පරාව**

භාවිතා කරන ලද ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය -..................................................
කාල පරාසය -..................................................
ක්‍රියාත්මක වේගය මනින ඒකකය -..................................................

**හතරවන පරම්පරාව**

භාවිතා කරන ලද ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය -..................................................
කාල පරාසය -..................................................
ක්‍රියාත්මක වේගය මනින ඒකකය -..................................................

08. සත්‍ය ද අසත්‍ය ද යන්න තෝරන්න.
මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය මැනීම සඳහා හර්ට්ස් (Hertz-Hz) යන ඒකකය භාවිත කරයි.

i. සත්‍යයි.
ii. අසත්‍යයි.

09. සත්‍ය ද අසත්‍ය ද යන්න තෝරන්න.
මධ්‍ය සැකසුම් ඒකකය පරිගණකයේ මොළය ලෙස සැලකිය හැකිය.

i. සත්‍යයි.
ii. අසත්‍යයි.

10. නිවැරදි පිළිතුරු තෝරන්න.
නවීන පරිගණක වල වේගය මැනීම සඳහා යොදා ගන්නා ඒකක වන්නේ,

i. මෙගා හර්ට්ස්ය.
ii. රික්තක නළය.
iii. ගිගා හර්ට්ස්ය.
iv. IBM 360 ය.